සමිර හේරත්

**නිසැක ජය අස්වැල**

ප්‍රශ්ණ පත්‍ර අංක - 01

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය**

07 -සංවර්ධන සන්නිවේදනය

කාලය පැය - 2

**1· සංවර්ධන සන්නිවේදනය පිළිබඳ මතයන් කිහිපයක් පහත දැක්වෙයි·**

**පහළින් ඉහළට සංවර්ධනය**
**ස්වං විශ්වාසය ගොඩනැගීම**
**මාධ්‍ය ඒකාබද්ධතාවය**
**ස්වදේශීය දැනුම හා ජන මාධ්‍ය භාවිතය**
**බලය බෙදා ගැනීම**

**ඉහත මතයන් ඉදිරිපත් කරන ලද්දේ,**

(1) පෝල් පී ස්ටීවන් විසින්
(2) නයර් හා වයිට්ගේ භුවමාරු මාදිලිය
(3) ගාන්ධිතුමන්ගේ සංවර්ධනය පිළිබඳ සංකල්පය
(4) චීන ආකෘතිය මගින්ය
(5) ෆෝල් ලැසාඩ් ෆේල්ඩ්

**2· ග්‍රාම සේවා කොට්ඨාශය තම බල ප්‍රදේශය කර ගන්නා ලද 1977 දී ආරම්භ වූ ප්‍රජා සහභාගීත්ව සංවිධානය වන්නේ,**

(1) ප්‍රදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරය
(2) සණස ව්‍යාපාරය
(3) සමෘර්ධි ව්‍යාපාරය
(4) ග්‍රාමෝදය මණ්ඩල ව්‍යාපාරය
(5) ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය

**3· රජය මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ජනතාව තුළ ඇති දූර්මත ඉවත් කර විශ්වාසය ඇති කිළරීමට රූපවාහිනී මාධ්‍ය යොදා ගනිමින් කෙටි වාර්තා චිත්‍රපට ඉදිරිපත් කිරීමට එක්තරා රටක් තීරණය කරන ලදී මෙම ක්‍රියාවලිය වඩාත් සමීප වන සංවර්ධන සන්නිවේදනය පිළිබඳ බටහිර මතවාදය ඉදිරිපත් කරන ලද්දේ,**

(1) එවරට් එම් රොජර්ස්
(2) පෝල් පී ස්ටීවන්
(3) ඩැනියෙල් ලර්නර්
(4) විල්බර් ශ්‍රාම්
(5) ලූෂන් පායි

**4· ස්වදේශික කර්මාණ්ත පිළිබඳ සුභවාදී ආකල්පයක් ඇති කිරීමට ගාන්ධි තුමන් උපයෝගී කරගනු ලැබුවේ,**

(1) චරකය, ලුණු, කදාර් රෙදි, රාම රාජ්‍යය
(2) ලුණු, රාම රාජ්‍යය, රාජ රාජය, චරකය
(3) ස්ව රාජ්‍යය, චරකය, ලුණු, රාමරාජය
(4) ස්ව රාජ්‍යය, රාම රාජ්‍යය, රාජ රාජ්‍ය,ය ලුණු,
(5) ස්ව රාජ්‍යය, රාම රාජ්‍යය, චරකය, ලුණු

**5· 1973 බිහි වූ ගුවන් විදුලි සංස්ථාවේ රිච්වේ තිලකරත්න යුගයේදී එවකට ක්‍රියාත්මක වූ වගා සංග්‍රාමය පිළිබඳ පිණිවිඩ ගුවන්විදුලිය මගින් ජනතාගත කරන ලදී එහි අවශ්‍යතාවයක් නොවන්නේ,**

(1) අවම පිරිවැයක් මත භාවිතය පහසු වීම.
(2) සරල වැඩසටහන් ආකෘති භාවිතය.
(3) අවම තාක්ෂණය භාවිතය.
(4) කාලානුරූපීව සිය වැඩසටහන් ආකෘති වෙනස් කිරීම.
(5) පුද්ලික අංශයේ මාධ්‍ය කෙරෙහි මූලික අවධානය තැබීම.

**6· නවෝත්පාදන විසරණය යනුවෙන් හඳුන්වන්නේ,**

(1) විල්බර් ශ්‍රාම් ඉදිරිපත් කළ අදහසකි.
(2) දේශපාලන මතපැතිරවීම පිළිබඳ අදහසකි.
(3) නව සොයාගැනීම් හා තාක්ෂණය ප්‍රජාවට හඳුන්වා දීමකි.
(4) නූතන සන්නිවේදන සංකල්පයන්ගේ මූලික ලක්ෂණයකි.
(5) නූතන සන්නිවේදන සංකල්පයන් හා බැඳුණු නිර්වචනයකි.

**7· තිරසාර සංවර්ධනය වඩාත් වැදගත් බව නූතන සමාජයේ පිළිගැනීමයි තිරසාර සංවර්ධනය යනු?**

(1) රටක් මුළුමනින්ම කෘෂි කර්මාන්තයේ ස්වයං පෝෂිත කිරීම.
(2) ජාතික සංවර්ධනය උදෙසා ගොඩනැගිලි හා මහා මාර්ග වැඩි වශයෙන් ඉදි කිරීමයි.
(3) පරිසරය සුරක්ෂිත කිරීමට සිදුකරනු ලබන ක්‍රියාවලියකි.
(4) දිගු කාලීන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමකි .
(5) ගෝලීයකරණයට උචිත පරිදි රටක ආර්ථිකය සංවර්ධනය කිරීමකි.

**8· එවරට් එම් රොජර්ස් සංවර්ධන සන්නිවේදනය පිළිබඳ දක්වන අදහස් අතුරින් වැදගත්ම අදහස වන්නේ,**

(1) ජාතික න්‍යාය පත්‍රය සැකසීම.
(2) ජන සන්නිවේදනය හා අධ්‍යාපණය අතර ඇති සම්බන්ධතාවය,
(3) සංවර්ධනය පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීම.
(4) පොදු ජනතාව පාලන තන්ත්‍රයට සහභාගී කර ගැනීම.
(5) නවෝත්පාදන විසරණය.

**9· වී අස්වනු නෙලීම සඳහා නිපදවන ලද නව යන්ත්‍රයක් ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීමට අවශ්‍යය විය ඒ සඳහා ගොවි සංවිධානයක් විසින් දිවයිනේ වී වගා කරනු ලබන ප්‍රදේශවල නියමු ව්‍යාපෘති ගණනාවක් පවත්වන ලදී සංවර්ධන සන්නිවේදන දෘෂ්ටි කෝණයෙන් මෙම ක්‍රියාව වඩාත් සමීප වන්නේ**

(1) එවරට් එම් රොජර්ස්
(2) පෝල් පී ස්ටීවන්
(3) ඩැනියෙල් ලර්නර්
(4) විල්බර් ශ්‍රාම්
(5) ලූෂන් පායි

**10· සම්ප්‍රදායික සමාජ සංවර්ධනය උදෙසා සම්ප්‍රදායික මාධ්‍ය වඩාත් වැදගත් වන්නේ ඒවා**

(1) ප්‍රයෝගික නමුත් සංකීර්ණ නොවන නිසාය.
(2) හුරු පුරුදු සංඥා සංකේත හා සංදර්භ වලින් යුක්ත වන නිසාය.
(3) සෑම විටම සරල සුභාවිතයකින් යුක්ත වන නිසාය .
(4) වඩාත් නිර්මාණශීලී වන නිසාය.
(5) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක නිසාය.

**11·සංවර්ධන සන්නිවේදනයේදී ප්‍රජාව බලගැන්වීම පිණිස යොදා නොගන්නා භාවිතයක් වන්නේ**

(1) ස්වයං විශ්වාසය ගොඩනැගීම.
(2) යැපීම් මානසිකත්වය බැහැර කිරීම.
(3) මාධ්‍ය ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම.
(4) ප්‍රජා සහභාගීත්ව වර්ධනය.
(5) සංස්කෘතික අනන්‍යතාවය ගොඩ නැගීම.

**12· ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනය සඳහා ඵලදායීව සහභාගීවන සංවර්ධන සන්නිවේදන ආකෘතිය වන්නේ,**

(1) ප්‍රජා මාධ්‍ය ආකෘතිය.
(2) මාඕ සේතුන්ගේ චීන ආකෘතිය.
(3) ගාන්ධි තුමන්ගේ සංවර්ධනය පිළිබඳ සංකල්පය.
(4) නයර් වයිට්ගේ හුවමාරු මාදිලිය.
(5) ෆාල් ලැසාඩ් ෆෙල්ඩ්ගේ දෙපියවර ආකෘතිය.

**13· එවරට් එම් රොජර්ස් ඉදිරිපත් කළ සංවර්ධනය පිළිබඳ බටහිර මතවාදය වන්නේ,**

(1) ග්‍රාහකයාගේ ක්‍රියාකාරීත්වය ලබා ගැනීමට සමත්වීම.
(2) පොදු ජනතාව හැකිතාක් පාලන තන්ත්‍රයට සහභාගීකර ගැනීමට ජන මාධ්‍ය භාවිතය.
(3) ග්‍රාහකයාගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීම.
(4) සංවර්ධනය පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීම.
(5) සම්ප්‍රදායික සමාජයන්හි නව හැකියාවන් ව්‍යාප්ත කරලීමට ජන මාධ්‍ය භාවිතය.

**14· යම් රටක පවතින තත්ත්වය වැඩි දියුණු කිරීමේදී එම දියුණුවේ අංශ නවීකරණය සමග සම්බන්ධ වේ එම සම්බන්ධතාව විග්‍රහ කිරීමේදී වැදගත් නොවන අංගයක් වන්නේ**

(1) නවීකරණය
(2) බටහිරකරණය
(3) විශ්වීයකරණය
(4) නාගරීකරණය
(5) කාර්මීකරණය

**15· සමුපකාර සමිති ව්‍යාපාරයේ කාර්ය වන්නේ,**

(1) රජයේ ආහාර සලාක බෙදා හැරීම.
(2) ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ පිරිස් එක්කර ගැනීම.
(3) සැම අයෙකුගේම මූලික අවශ්‍යතා ඉටුවන පරිදි සම්පත් බෙදා දීම.
(4) දුප්පත්කමින් තොර ශ්‍රී ලංකාවක් ගොඩනැගීම.
(5) මනුෂත්වය හා ආධ්‍යාත්මික වටිනාකම් පුද්ගලයා තුළ ඇති කිරීම.

**16· සංවර්ධන ක්‍රියාවලියේදී රටක් නවීකරණය කිරීමට ජනමාධ්‍ය අවශ්‍යය වන බව අවධානය කරන ලද්දේ**

(1) ඩඩ්ලි සියර්ස්
(2) ඉතියෙල්ද සෝලා පූල්
(3) ඩැනියෙල් ලර්නර්
(4) විල්බර් ශ්‍රාම්
(5) එවරට් එම් රොජර්ස්

**17· කඳුකර ප්‍රදේහයේ ග්‍රාමීය ප්‍රජාව ස්වබාවික ආපදා වලින් ආරක්ෂා කිරීමට යොදාගනු ලබන ව්‍යාපෘතියක් සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමය වන්නේ,**

(1) පුවත්පත් අතිරේක පල කිරීම.
(2) නව මාධ්‍ය භාවිතය.
(3) ගෙන් ගෙට ඇවිදීම මගින් පැහැදිලි කිරීම.
(4) පෝස්ටර් හා අත් පත්‍රිකා භාවිතය.
(5) ප්‍රජා ගුවන්විදුලි සේවා භාවිතය.

**18· සංවර්ධන සන්නිවේදනයේ නවීන ක්‍රම සම්බන්ධ සදොස් ප්‍රකාශය වන්නේ**

(1) **ග්‍රාහක පිරිස නිවැරදිව හඳුනාගෙන කටයුතු සැළසුම් කිරීම.**
(2) **යොදාගන්නා භාෂාව ඉතා වැදගත්වීම.**
(3) **විශේෂඥයින් විසින් සැළසුම් කටයුතු කිරීම.**
(4) **ග්‍රාහකයන්ට වඩාත් සමීප බවක් දැක්වීම.** (5) **නවීන තාක්ෂණය සමග අනුබද්ධ වීම.**

**19· මාඕ සේතුන් විසින් දියත් කළ සංවර්ධන සන්නිවේදන කාර්යයේදී ඒ ඒ ප්‍රදේශවල වෙසෙන පොදු ජනතාව සමග එකට එක්ව සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවය ලැබිය යුතු ප්‍රශ්ණ තෝරා ගැනීම යනු**

(1) ප්‍රමාණීකරණය
(2) සාරාංශකරණය
(3) ප්‍රජානනය
(4) ක්‍රියාවට පරිවර්ථනය කිරීම
(5) සහභාගීත්ව ප්‍රවේශය

**20· සංවර්ධන සන්නිවේදනය පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ**

(1)1950 දශකයේ යුනෙස්කෝව විසින් මෙම සංකල්පය හඳුන්වා දෙන ලදී.
(2)දෙවන ලෝක යුධ සංග්‍රාමයට පෙර මෙම සංකල්පය පිළිබඳ කතිකාව ආරම්භ විය.
(3)සංවර්ධනය සඳහා සන්නිවේදන ක්‍රම යොදා ගැනීම පිළිබද පර්යේෂණයකි.
(4) කාර්මික රටවල සාර්ථක වූ තුන්වන ලෝකයේ රටවල අසාර්ථක වූ සංවර්ධන ක්‍රම නිසා ආරම්භ විය.
(5) සංවර්ධනය සඳහා නව සන්නිවේදන මාධ්‍ය යොදා ගැනීම මෙහි අවශ්‍යතාවයයි.

**21· ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රජා ගුවන්විදුලිය වන්නේ**

(1)**රජරට සේවය** (2)**වයඹ හඬ** (3)**මහඉළුක්පල්ලම ගුවන්විදුලිය**
(4) **රුහුණු සේවය** (5) **යාපනය සේවය**

**22· ශ්‍රී ලංකාවේ සමෘර්ධි අධිකාරියට අයත් නොවන අංශයක් ඇතුළත් වරණය වන්නේ**

(1)ග්‍රාම සංවර්ධන හා කර්මාණ්ත අංශය
(2)මහා සංගම් හා සමාජ
(3)කෘෂි හා ග්‍රාම සංවර්ධන අංශය
(4) ධීවර හා සත්ත්ව පාලන අංශය
(5) ප්‍රජා පාලන අංශය

**23· ගැමි මාධ්‍ය සංවර්ධන සන්නිවේදනය සඳහා යොදා ගැනීමේදී**

**A - ප්‍රජා සහභාගීත්වය තුළින් නිර්මාණය කළ හැකි වීම**
**B - පණිවිඩය පිළිබඳ විශ්වාසය ගොඩනගා ගැනීමට හැකිවීම**
**C - අවම වියදමක් යටතේ සංදේශය ඉදිරිපත් කළ හැකි වීම**
**D - ප්‍රජාවට ඉතා සමීප වන සේ පණිවිඩය සම්ප්‍රේශණය කළ හැකිය**

**ඉහත ප්‍රකාශ අතුරින්**

(1)A, B, C පමණක් නිවැරදිය
(2) B, C, D පමණකි නිවැරදිය
(3)A, B, , D පමණක් නිවාරදිය
(4) A, B, C, D යන සියල්ල වැරදිය
(5) A, B, C, D යන සියල්ල නිවැරදිය

**24· කුඩා කණ්ඩායම් නිර්මානය කිරීමෙන් ඒ තුළින් සමෘර්ධි සමිති ගොඩනැගීම මගින් ග්‍රාමීය පවුල් වල විභව ශක්තීන් හඳුනා ගැනීම හා එම ග්‍රාමීය ජනතාව ශක්තිමත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන්නේ**

(1)සෞඛ්‍ය අධ්‍යාපණ කාර්යාංශය (2)ශ්‍රී ලංකා සමෘර්ධි අධිකාරිය
(3)සර්වෝදය ව්‍යාපාරය (4) සණස ව්‍යාපාරය
(5) ග්‍රාමෝදය මණ්ඩල ව්‍යාපාරය

**25· සංවර්ධනය පිළිබඳ ආකල්පමය ගැටළු හා අභියෝග කිහිපයක් පහත දැකිවෙයි**

**A** - සංවර්ධන සංකල්ප වටහා ගැනීමේ ගැටළුව
**B** - පෙරදිග සමාජ වලට ආවේණික ස්ථායි බව
**C** - තොරතුරු පරිහරණයේ ගැටළු
**D - මාධ්‍ය වානිජකරණය වීම**
**E - දැඩි ආගමික කේන්ද්‍රීය බව**

**ඉහත කරුණු අතරින් ආකල්පමය ගැටළු පමණකි ඇති වරණය වන්නේ**

(1)A, B, C (2)A, B, E (3) B, C, E
(4) A, D, E (5) B, C, D

**26· පෝල් ලැසාඩ් ෆේල්ඩ් ඉදිරිපත් කරන ලද දෙපියවර ආකෘතියේ ජනමාධ්‍ය මගින් ලබා දෙන තොරතුරු ඉන් පසුව ගලායන්නේ**

(1)ග්‍රාහකයාගේ සිට මාධ්‍ය ආයතනය වෙත
(2)පාලකයාගේ සිට පුරවැසියා වෙත
(3) ජන මාධ්‍ය මගින් කුඩා කණ්ඩායම වෙත
(4) ජනමත නායකයන්ගේ සිට අනුගාමිකයන් වෙත
(5) නිලධාරීන් මගින් පොදු ජනතාව වෙත

**27·සංස්කෘතික සංවර්ධනයෙහිලා විද්‍යාත්මක පදනමකින් යුතුව ව්‍යාපෘති ජාත්‍යනතරව ක්‍රියාත්මක කරනු ලබන රට වන්නේ**

(1)ජාත්‍යන්තර ක්ෂමා ආයතනය (2)ජාත්‍යන්තර මුල්‍ය අරමුදල
(3) ලෝක බැංකුව (4) ලෝක සෞඛ්‍ය සංවිධානය
(5) යුනෙස්කෝ සංවිධානය

**28· නවීන සංවර්ධන ක්‍රම සම්බන්ධයෙන් පිළිගත හැකි මතය වන්නේ**

(1) නවීන තාක්ෂණය සමග සෘජු සම්බන්ධතාවයක් නොමැත.
(2) සංවර්ධනය සඳහා නවීන සන්නිවේදන ක්‍රම භාවිතය සැළසුම් කිරීම ඕනෑම අයෙකුට කළ හැකිය.
(3) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම වලින් වියුක්තව භාවිතා කල යුතුය.
(4) සම්මන්ත්‍රණ සාකච්ඡා ආදිය මෙයට අයත් නැත.
(5) නවින සන්නිවේදන ක්‍රම භාවිතයෙදී භාෂාව ගැන සැළකිලිමත් විය යුතුය.

**29· දුප්පත්කමින් තොර සුපොහෝගීත්වයෙන් තොර සමාජයක් යන දැක්මෙන් ක්‍රියාත්මත වූ සංවර්ධන සුසමාදර්ශය වනනේ,**

(1)**සණස ව්‍යාපාරය** (2) **සර්වෝදය ව්‍යාපාරය**
(3) සෞඛ්‍ය අධ්‍යාපණ කාර්යාංශය (4) සමෘර්ධි ව්‍යාපාරය
(5) ග්‍රාමෝදය මණ්ඩල ව්‍යාපාරය

**30· ජාතික සංවර්ධන සඳහා සහභාගීවීම එයින් වැලකී සිටිනවාට වඩා යහපත්ය යන මතය ප්‍රකාශ කරනු ලැබුවේ**

(1) එවරට් එම් රොජර්ස් (2) මාශල් මැක්ලුහන්
(3) ඩැනියෙල් ලර්නර් (4) විල්බර් ශ්‍රාම්
(5) ලුෂන් පායි

**31· ප්‍රජා සංවර්ධන වැඩසටහනක් සැළසුම් කිරීමේදී ප්‍රශස්ථ එළඹුම වන්නේ**

(1) විශේෂඥයන් සකස් කර ජනමත නායකයනට ලබාදීමයි.
(2) ප්‍රජාව සකස් කර විශේෂඥයන්ට ලබා දීමයි .
(3) ප්‍රජා අදහස් හා විශේෂඥ අදහස් සංකලනය කිරීමයි.
(4) විශේෂඥයන් සකස් කර ප්‍රජාවට ලබාදීමයි.
(5) ප්‍රජාවගේ අදහස් වලට දේශපාලන අනුමැතිය ලැබීමයි.

**32· සංවර්ධන සංදේහ නිර්මාණයේදී ප්‍රමුඛ අවධානයක් යොමුවිය යුත්තේ**

(1) යොදා ගන්නා මාධ්‍ය තෝරා ගැනීම පිළිබඳවය.
(2) ග්‍රාහකයා තුළ සුභවාදී ආකල්පමය වෙනසක් ඇති කිරීම පිළිබඳවය.
(3) විවිධාකාරයෙන් නිර්මාණශීලී සංදේශ ඉදිරිපත් කිරීම පිළිබඳවය.
(4) ග්‍රාහක කණ්ඩායම ආකර්ශනීය කර ගැනීම පිළිබඳවය.
(5) සංදේශ නිර්මානයට ගතවන කාලය හා වැයවන ශ්‍රමය පිළිබඳවය.

**33· ඉන්දියානු තොරතුරු ඉන්දියානු ඇසකින් ලෝකයට පෙන්වීම වැදගත් බව රාජ්‍ය නායකයෙකු පැවසුවේය ඔහුගේ මතයට අනුව කිසියම් රටක තොරතුරු ලෝකයට වාර්තා කළ යුත්තේ**

(1) එම රට පිළිබඳ සුභවාදී දෘෂ්ටියෙනි.
(2) ස්වදේශික ජන මාධ්‍ය නාලිකා තුළිනි .
(3) රටේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය වන අයුරිනි.
(4) රටේ සමාජ සංස්කෘතිය පිළිබඳ අවබෝධයකිනි.
(5) ඉහත සියල්ල නිවැරදිය.

**34· සංවර්ධන සන්නිවේදනය සඳහා සම්ප්‍රදායික මාධය යොදා ගැනීමේ වාසියක් නොවන්නේ**

(1) ගැමි සමාජයේම බිහිවීම.
(2) ජන විඥානයට සමීප වීම.
(3) ප්‍රතිපෝෂණ දැක්වීම මදක් ප්‍රමාද වීම.
(4) දේශපාලන හෝ වෙනත් බල කණ්ඩායම් වලට යටත් නොවේ.
(5) තේමාවට අදාල අන්තර්ගතයක් පැවතීම.

**35· සංවර්ධන සන්නිවේදනය පිළිබඳ නයර් හා වයිට්ගේ හුවමාරු ආකෘතිය පිළිබඳ සදොස් ප්‍රකාශය වන්නේ**

(1) පුරවැසියන් බල ගැන්වීම.
(2) ඉහළින් පහළට සංවර්ධනය.
(3) බිම් මට්ටමේ සහභාගීත්වය.
(4) සහභාගීත්ව තීරණ ගැනීම.
(5) අන්තර් පුද්ගල විශ්වාසය ගොඩනැගීම.

**36· සංවර්ධන සන්නිවේදනයේ මූලික ලක්ෂණ පිළිබඳ නිදොස් ප්‍රකාශය වන්නේ**

(1) ස්වං විශ්වාසය බිඳ දමා සාමූහික විශ්වාසය ඇති කිරීමයි.
(2) යැපීම් මානසිකත්වය වර්ධනය කිරීමයි.
(3) ප්‍රජා සහභාගීත්ව වර්ධනයයි.
(4) සංවර්ධන ක්‍රියාවලිය විමධ්‍යගත නොකිරීම.
(5) සංස්කෘතික අනන්‍යතාව බැහැර කිරීම.

**37· සංවර්ධනය පිළිබඳ ගැටළුවක් වන තොරතුරු අසමතුලිතතාවයට අයත් නොවන්නේ**

(1) **තොරතුරුකරණයේ බටහිර ආදිපත්‍යය.**
(2) **තොරතුරු පරිහරණයේ ගැටළු.**
(3) **මාධ්‍ය වානිජකරණය වීම.**
(4) **පෙරදිග රටවල සම්බන්ධතා සම්ප්‍රදායිකවීම.**
(5) **බටහිර සබඳතා යාන්ත්‍රික කේන්ද්‍රීය වීම.**

**37· සන්නිවේදන සුසමාදර්ශ වලට අයත් නොවන්නේ**

(1)සර්වෝදය ව්‍යාපාරය
(2) සෞඛ්‍ය අධ්‍යාපණ කාර්යාංශය
(3) ග්‍රාමෝදය මණ්ඩල ව්‍යාපාරය
(4) සණස ව්‍යාපාරය
(5) සමෘර්ධි ව්‍යාපාරය

**39· සංවර්ධන සංදේශය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ**

(1)සංවර්ධන සංදේශනය මගින් සමාජ අළෙවිකරණයක් සිදුවෙයි.
(2) මෙහිදී සන්නිවේදකයා ගැන වැඩි අවධානයක් යොමුවෙයි.
(3) මාධ්‍ය මිශ්‍රයක් භාවිතා කරයි.
(4) ජන මාධ්‍යය පමණක් භාවිතා නොකරයි.
(5) සම්ප්‍රදායික මාධ්‍ය අවශ්‍යය විට භාවිතා කළ හැකිය.

**40· චීන සංවර්ධන සන්නිවේදන ආකෘතියේ දළ ජාතික නිෂ්පාදිත වැඩි කිරීම පිළිබඳ පමණක් නොව තවත් නිර්ණායක කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි ඒවාට අයත් නොවන්නේ**

(1) ජාතික සංවර්ධනයට අධාල සැළැස්මක් ක්‍රියාවට නැංවීම.
(2) නිලධාරී පැලැන්තියේ බලය පැතිරීම අවම කිරීම.
(3) කාර්මීකරණයට වහල් නොවීම.
(4) ජනතාව හා රජය අතර පරතරය අවම කිරීම.
(5) කුඩා කණ්ඩායම් වලට මූලිකත්වය ලබාදීම.

**41· මහාචාර්ය විමල් දිසානායක මහතා සම්ප්‍රදායික මාධ්‍ය භාවිතය පිළිබද දක්වන ලද අදහසක් නොවන්නේ**

(1)**සම්ප්‍රදායික මාධ්‍ය විශ්වාසනීයත්වයෙන් යුක්තය.**
(2) **සම්ප්‍රදායික මාධ්‍ය ග්‍රාහකයන්ගේ ක්‍රියාකාරීත්වය ලබාගනියි.**
(3) **සම්ප්‍රදායික මාධ්‍ය ගැමියන්ට හුරුපුරුදු සංඥා හා සාධක වලින් යුක්ත නැත.**
(4) නවීන මාධ්‍ය තරමකට ආගන්තුක වූ ස්වභාවයක් ඇත.
(5) ප්‍රභුවරුන්ගේ සිතැගියාව බැහැර කරයි.

**42· සංවර්ධනය යනු නූතන ලෝකයේ යක්ෂාවේෂව සිටින බලවේග කිහිපයකට පහර දීමයි එම බලවේග නම් මන්දපෝෂණය රෝග නුගත්කම මුඩුක්කු විරැකියාව හා සමාජ අසමානතාවයයි යන නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ**

(1) එවරට් එම් රොජර්ස් (2) පෝල් පී ස්ටීවන්
(3) ඩැනියෙල් ලර්නර් (4) විල්බර් ශ්‍රාම්
(5) ලූෂන් පායි

**43· තුන්වන ලෝකයේ රටවලට අයත් නොවන රටක් ඇතුළත් වරණය වන්නේ**

(1) **ඉන්දියාව, පාකිස්ථානය, ජැමෙයිකාව, බංගලාදේශය**
(2) **ශ්‍රී ලංකාව, රුසියාව, අප්‍රිකාව, සෝමාලියාව**
(3) **සෝමාලියාව, භූතානය, නේපාලය, ඉන්දියාව**
(4) **ශ්‍රී ලංකාව, පාකිස්ථානය, බංගලාදේශය, ඉන්දියාව**
(5) **සෝමාලියාව, ජැමෙයිකාව, ඉතියෝපියාව ,සුඩානය**

**44· සංවර්ධන යනුවෙන් අපේක්ෂා කරනු ලබන්නට අයත් නොවන්නේ**

(1) **ආර්ථික සංවර්ධනය** (2) **ආගමික සංවර්ධනය** (3) **සමාජ සංවර්ධනය**
(4) **අධ්‍යාපණික සංවර්ධනය** (5) **පරිසරාත්මක සංවර්ධනය**

**45· ප්‍රදේශයක් ඉලක්ක කොටගත් සංවර්ධන ව්‍යාපෘතියක සමාරම්භක උත්සවය පිළිබද පෝස්ටරයක් දිවයින පුරා ප්‍රදර්ශනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ**

(1) අවශ්‍යතා පිළිබද උපරිම මහජන අවබෝධය ලබාදීම.
(2) දේශපාලන වාසි ලබා ගැනීමට උත්සාහ දැරීමකි.
(3) මහජන විරෝධතා ඇතොත් ඒවා අවම කර ගැනීමට.
(4) ප්‍රදේශයේ ජනතාවට මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් පුළුල් අවබෝධයක් ඇති කිරීමට.
(5) ඉහත සියල්ල වැරදිය.

**46· B සමස්ථ ප්‍රජාවෙන් සියයට 13.5 ක් වන පිරිස මුල් කණ්ඩායම දෙස බලා ඉක්මනින් වෙනස් වන පිරිසයි ඔවුන් හදුන්වන්නේ**

(1) **ප්‍රමාදිත බහුජනතාව** (2) **මත නායකයන්**
(3) **ප්‍රමුඛ බහුජනතාව** (4) **ප්‍රමුඛ අනුගාමිකයන්ය**
(5) **ප්‍රමාදී ග්‍රාහකයන්ය**

**47· සම්ප්‍රදායික මාධ්‍යන්ට අයත් නොවන්නේ**

(1) **ගැමි ක්‍රීඩා** (2) **ශාන්ති කර්ම** (3) **ජන සංගීතය**
(4) **ජන නර්ථනය** (5) **ගැමි නාට්‍ය**

**48·** ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදයන්ගේ ස්වභාවයට අයත් නොවන්න

(1) ඇගයුම (2) න්‍යායමනය (3) වැඩ බෙදා ගැනීම
(4) කාර්ය බෙදා ගැනීම (5) සැළසුම් කිරීම

**49·** නවීන සන්නිවේදන ක්‍රමයන් නොවන්නේ

(1) නව මාධ්‍ය (2) චිත්‍රපට (3) සගරා
(4) සාකච්ඡා (5) වැඩමුළු

**50·** සර්වොදව ව්‍යාපාරය විසින් ප්‍රජාව සමග එක්ව කරනු ලබන සෑම ක්‍රියාවක්ම පියවර හතකින් යුක්තය එයට අයත් නොවන්නේ

(1) පුද්ගලයාගේ සංවර්ධනය (2) පවුලෙහි සංවර්ධනය
(3) ආසියාවේ සංවර්ධනය (4) ලෝකයේ සංවර්ධනය
(5) නගරයෙහි සංවර්ධනය